වගා ආධාර චක්‍රලේඛ අංක:19

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 349, ගාලු පාර,
කොළඹ.03.
1989.03.1[illegible] දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ
තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් වෙත.

**මාතෘකාව:** වගා සහනාධාර පිළිබඳව කුඩා තේ වතු හිමියන් වෙත දැනුම්දීම සඳහා වගා/පොදු -8 ආකෘතිය භාවිත කිරීම

1.0 **පරමාර්ථය:**

කුඩා තේ ඉඩම්වල වගා සහනාධාර පරීක්ෂණ පවත්වන අවස්ථාවලදී එම පරීක්ෂණයේ ප්‍රතිඵලය පිළිබඳව කෙලින්ම ඉඩම් හිමියන්ට දැනුම් දෙන අතර, එහි සම්පූර්ණ කළ යුතු යම් අවශ්‍යතාවයක් ඇතොත් ඒ පිළිබඳව ලිඛිත උපදෙස්දීම සඳහා වගා/පොදු-8 (සංශෝධිත) ආකෘතිය භාවිත කරන ආකාරය පැහැදිලි කිරීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථයයි.

2.0 **ක්‍රියා මාර්ගය:**

2.1 මේ සමග අමුණා ඇති වගා/පොදු -8 1988 දෙසැම්බර් සංශෝධිත ආකෘතිපත්‍රය සියලුම තේ වගා සහනාධාර ගෙවීම් පරීක්ෂණවලදී පරීක්ෂණ නිලධාරීතැන විසින් පහත දක්වා ඇති පරිදි සම්පූර්ණකොට ඉඩම හිමිකරුට හෝ වගාකරුට භාර දිය යුතුය.

(අ) පරීක්ෂණය අනුව ගෙවීම නිර්දේශ කරන අවස්ථාවලදී ඒ බව එහි පළමු වගන්තිය මගින් දන්වන්න.

(ආ) සහනාධාර පරීක්ෂණය කරන අතර ඉඩමේ තේ වගාව පිළිබඳව උපදෙස් දීමටද ඇත්නම් එකී උපදෙස් එහි දෙවන වගන්තිය සමග සාරාංශයක් ලෙස සඳහන් කරන්න.

(ඇ) පරීක්ෂණය අනුව ගෙවීම නිර්දේශ නොකරන අවස්ථාවකදී ඒ සඳහා හේතු දක්වමින් අදාළ බීම් කොටසේ සම්පූර්ණ කළයුතු අවශ්‍යතා පිළිබඳව එහි තුන්වන වගන්තිය මගින් පැහැදිලිව දැනුම් දීමට කටයුතු කරන්න.

2.2 ඉහත සෑම අවස්ථාවකදීම ඉඩම හිමිකරු හෝ වගාකරු/නියෝජිතයා ලිපිය භාර ගත් බවට අනු පිටපත්වල අත්සන් කරවාගත යුතු අතර, දෙවන පිටපත ප්‍රාදේශීය කළමනාකරු වෙත යැවීමට කටයුතු කරන්න.

2.3 1986.12.17 දිනැති ''තේ වගා සහනාධාර'' මැයෙන් යුතු චක්‍රලේඛ ලිපි අංක 145 හි මෙම කරුණු පිළිබඳව දී ඇති උපදෙස් මෙම චක්‍රලේඛය අනුව නැවත සංශෝධනය කරනු ලැබේ.

වී.කේ. නානායක්කාර
සභාපති

පිටපත්:-
1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(සංවර්ධන)
3. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මුදල්)
4. අභ්‍යන්තර විගණක
5. ක්‍රම සම්පාදන නිලධාරී
6. ගණකාධිකාරී(සහනාධාර)
7. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
8. සංඛ්‍යා ලේඛන නිලධාරී

39

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

198 ........................ දින

..................................................මහතා / මහත්මිය,

**ඉඩමේ නම :**

**අවසර පත්‍ර අංකය :**

අද දින ඔබගේ ඉඩමේදී පවත්වන ලද වගා සහනාධාර යටතේ ........................වන ආධාර කොටසට /* කොටස්වලට අදල පරීක්ෂණය පිළිබඳවයි.

* යථෝක්ත පරීක්ෂණයේදී ඔබගේ ඉඩම එකී ආධාර කොටස / කොටස් ලැබීම සඳහා නියමිත අවශ්‍යතා සම්පූර්ණ කර තිබූ බැවින් ගෙවීම් නිර්දේශ කර ප්‍රාදේශීය කළමනාකරු වෙත යවන බව කරුණාවෙන් සලකන්න.

* ඔබගේ ඉඩම පිළිබඳව පහත සඳහන් පරිදි උපදෙස් දෙනු කැමැත්තෙමි.

* එම පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු අනාවරණය වී ඇත. එබැවින් එකී අවශ්‍යතා මෙහි දක්වෙන උපදෙස් පරිදි සම්පූර්ණකර මා වෙත පිටපතක් සහිතව........................ ප්‍රාදේශීය කළමනාකරු වෙත දනුම් දෙන ලෙස කරුණාවෙන් දන්වමි.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

අත්සන : ..............................

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි:......

ඉඩම පෙන්වූ අයගේ නම : ................................ ..............................

ලිපිය භාරගත් බවට අත්සන : ................................ නම : ..............................

දිනය : ................................ ලිපිනය: ..............................

පිටපත—ප්‍රාදේශීය කළමනාකරු : ................................ ..............................

* නොගැලපෙන වගන්ති කපා හරින්න.

සංශෝධිත මුද්‍රණය: 1988 දෙසැ.

... 313/10/88